කම්කරු දෙපාර්තමේන්තුව
தொழில் திணைக்களம்
DEPARTMENT OF LABOUR
ශ්‍රම ප්‍රමිති අංශය
தொழிற்தரப் பிரிவு
Labour Standards Division

මගේ අංකය / எனது இலக்கம் / My Number } LS/S&O/SH/2026
ඔබේ අංකය / உமது இலக்கம் / Your Number }
දිනය / திகதி / Date } 2026.04. 24

අදාළ සියලුම සේව්‍ය හා සේවක පාර්ශවයන් වෙත

**<u>2026 වෙසක් පෝය දිනට පසු දිනට යෙදෙන ප්‍රසිද්ධ නිවාඩු දිනය සම්බන්ධයෙන් පැහැදිලි කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් නිකුත් කරන ලද 2026.04.09 දිනැති නිවේදනය හා බැදේ. එමගින් අදාළ සියලු පාර්ශවයන් දැනුවත් කරන ලද්දේ වෙසක් පෝය දිනට පසුව යෙදෙන ප්‍රසිද්ධ නිවාඩු දිනය, ඒ වන විට සංශෝධනය වී නොතිබීම හේතුවෙන් අදාළ ප්‍රසිද්ධ නිවාඩු දිනය 2026.05.02 දිනයටම යෙදෙන බවයි.

02. නමුත් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයාගේ අත්සනින් නිකුත් කර ඇති අංක 2485/14 සහ 2026.04.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය (ඇමුණුම I) මගින් පූර්ව නිවේදනය සංශෝධනය කරමින් වෙසක් පෝය දිනයට පසු දින නිවාඩුව 2026.05.31 දිනයට යෙදෙන බව ප්‍රකාශයට පත් කර ඇත.

03. ඒ අනුව, 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව, 2026 වර්ෂයට අදාළ ප්‍රසිද්ධ නිවාඩු දින 08 පහත දැක්වෙන පරිදි බලපැවැත්වෙන බව කාරුණිකව දන්වා සිටිමි.

| | | | | |
|---|---|---|---|---|
| 01. | ජනවාරි | 15 | (බ්‍රහස්පතින්දා) | දෙමළ තෛපොංගල් දිනය |
| 02. | පෙබරවාරි | 04 | (බදාදා) | නිදහස් සමරු දිනය (ජාතික දිනය) |
| 03. | අප්‍රේල් | 13 | (සඳුදා) | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනයට පෙර දිනය |
| 04. | අප්‍රේල් | 14 | (අඟහරුවාදා) | සිංහල හා දෙමළ අලුත් අවුරුදු දිනය |
| 05. | මැයි | 01 | (සිකුරාදා) | ලෝක කම්කරු දිනය |
| 06. | මැයි | 31 | (ඉරිදා) | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය |
| 07. | අගෝස්තු | 26 | (බදාදා) | (මිලාද්-උන්- නබි) නබිනායක තුමාගේ උපන්දිනය |
| 08. | දෙසැම්බර් | 25 | (සිකුරාදා) | නත්තල් උත්සව දිනය |

04. එසේම වෙසක් පෝයට පසුදින සඳහා ව්‍යවස්ථාපිත නිවාඩු හිමිකම් පවතින පඩිපාලක සභාවන් සඳහා ද මෙම සංශෝධනය අදාළ වේ.

එන් ආර් රණවක
කම්කරු කොමසාරිස් - ශ්‍රම ප්‍රමිති අංශය

එන්. ආර්. රණවක
කම්කරු කොමසාරිස්
ශ්‍රම ප්‍රමිති අංශය
කම්කරු දෙපාර්තමේන්තුව

අත්- කලේ/ එච් එම් ඩී එන් කේ වටලියද්ද
කම්කරු කොමසාරිස් ජනරාල්

එක්ව කැපවෙමු ළමා ශ්‍රමය පිටු දකිමු
ஒன்றிணைவோம் சிறுவர்தொழிலை இல்லாதொழிப்போம்

12 වන මහල, "මෙහෙවර පියස" ගොඩනැගිල්ල, කොළඹ 05.
12 ஆம் தளம், "மெஹெவர பியெச" கட்டிடம், கொழும்பு 05.
12th Floor, "Mehewara Piyesa" Building, Colombo 05.
දුරකථන / தொலைபேசி / Telephone } 011-2104859
ෆැක්ස් / பெக்ஸ் / Fax } 011-2368094
ඊ-මේල් / மின்னஞ்சல் / Email } labourstandardsdiv@gmail.com
වෙබ් අඩවිය / இணையத்தளம் / Website } www.labourdept.gov.lk